සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023

Second Term Test - Grade 11 - 2023

# ශිල්ප කලා - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- ලබා දී ඇති වරණ අතුරින් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර සහිත වරණය තෝරා ලබා දී ඇති පිළිතුරු පත්‍රයේ (x) ලකුණ යොදන්න.

---

01. මිනිසාගේ සිතුම් පැතුම් අවශ්‍යතා මුල්කර ගනිමින් ජනකලා බිහි වී ඇත. ඒවා දෘෂ්‍ය කලා ශ්‍රව්‍ය කලා ලෙස වර්ග වේ. දෘෂ්‍ය කලාවක් නොවන්නේ,
    (1) පේෂකර්මාන්තය (2) ලී කැටයම් (3) ලාක්ෂා කර්මාන්තය (4) ගොයම් කවි


02. බීරළු රේන්ද කර්මාන්යේ දී භාවිත කරනු ලබන මෙවලමකි.
    (1) සැලැක්කය (2) බීරළු කොට්ටය (3) රේන්ද කටුව (4) නූල් පන්දුව

03. පිත්තල කර්මාන්තයේ දී පිත්තල ලෝහය සකස් කරනු ලබන්නේ වෙනත් ලෝහ දෙකක් 2 : 1 අනුපාතයට මිශ්‍ර කිරීමෙනි. එම ලෝහ වර්ග දෙක වනුයේ,
    (1) තඹ හා සින්ක් (2) තඹ හා කොපර්
    (3) තඹ හා තුත්තනාගම් (4) කොපර් හා තුත්තනාගම්


04. $A_4$ කඩදාසියක සම්මත මිනුම් ප්‍රමාණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) 210 mm × 297 mm (2) 420mm × 594mm
    (3) 814mm × 1189mm (4) 105mm × 148mm


05. ජ්‍යාමිතික ඇඳීමේ දී වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා යොදා ගන්නා රේඛාව වන්නේ කුමක් ද?
    (1) සිහින් අඛණ්ඩ රේඛා (2) සිහින් දාම රේඛා
    (3) කඩරේඛා (4) ඝන අඛණ්ඩ රේඛා

06. මෙම රූපයේ අඳුරු කළ කොටස හඳුන්වන නම කුමක් ද?
    (1) වෘත්ත ජ්‍යාය
    (2) කේන්ද්‍රික ඛණ්ඩය
    (3) වෘත්ත පාදය
    (4) වෘත්ත චාපය




07.





ඉහත දක්වා ඇති රූපසටහන් පිළිවෙලින් නිවැරදිව නම් කර ඇති පිළිතුර තෝරන්න.
    (1) ඝනරූප හා විකසනය. (2) තල රූපීය හා විකසනය.
    (3) තල රූප හා ඝන මාධ්‍ය. (4) ත්‍රිමාණ රූප හා ඝන රූප.

08. පහත රූපසටහනේ සැඟිදාර දැක්වීමට හා සමමිතික බව දැක්වීමට යොදාගෙන ඇති රේඛා වර්ගය වන්නේ,




(1) ඝන අඛණ්ඩ රේඛා, කඩරේඛා
(2) ඝන දාම රේඛා සිහින් දාම රේඛා
(3) කඩ රේඛා, සිහින් දාම රේඛා
(4) සිහින් අඛණ්ඩ රේඛා, ඝන රේඛා

09. ඉලිප්සයක නාභිය සොයාගන්නා ආකාරය වන්නේ,

(1) ඉලිප්සයේ කේන්ද්‍රයේ සිට මහා අක්ෂය දෙපසට ඡේදනය කිරීම.
(2) මහා අක්ෂයේ කෙළවරසිට මහා අක්ෂය දෙපසට හා සුළු අක්ෂයට ඡේදනය කිරීම.
(3) මහා අක්ෂයේ සම්පූර්ණ දුර කවකටුවටගෙන ඕනෑම සුළු අක්ෂයක කෙළවර සිට මහා අක්ෂය ඡේදනය කිරීම.
(4) මහා අක්ෂයේ අඩක දුර කවකටුවට ගෙන සුළු අක්ෂයේ ඕනෑම කෙළවරක් කේන්ද්‍රය කර මහා අක්ෂය දෙපසට ඡේදනය කිරීම.

10. වෘත්තයක චාපයකින් හා ජ්‍යායකින් අන්තර්ගත වූ කොටස ඇතුළත් රූපය තෝරන්න.



(1) (2) (3) (4)

11. විචිත්‍රවත් වර්ණ සියල්ල ම මූලික වර්ණ පදනම්ව ගොඩනැගී ඇත. මූලික වර්ණ ලෙස හඳුන්වන්නේ,


(1) කොළ, නිල් හා රතු පාටයන් ය. (2) රතු, නිල්, කහ පාටයන් ය.
(3) කහ, රතු, තැඹිලි පාටයන් ය. (4) රතු, නිල් හා දුඹුරු පාටයන් ය.

12. රෙදි පින්තාරු කිරීමේ දී පින්සල අත්‍යාවශ්‍ය උපකරණයකි. පින්සලක් තෝරා ගැනීමේ දී සැලකිලිමත්විය යුතු නිවැරදි කරුණු සහිත පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A - ස්වභාවික කෙඳිවලින් සැකසූ පින්සල විශිෂ්ට ගුණයෙන් යුතුය.
B - පින්සලේ ඇති කෙඳිවල ඝනකම අනුව පින්සල් අංක කරනු ලැබේ.
C - වර්ණ ගැලපීමෙන් පසු සෝදා පිසදා තැබිය යුතුය.
D - පින්සල් සැකසීම සඳහා යොදා ගන්නේ කෘත්‍රිම කෙඳි පමණි.

(1) ABC (2) BCD (3) DAB (4) ADC

13. පහත මෝස්තරය අයත්වන පිළි අලංකරණ ක්‍රමය වන්නේ,



(1) ගැටපඬු මුද්‍රණය
(2) බතික් මුද්‍රණය
(3) පිටපත් මුද්‍රණය
(4) සිදුරු තහඩු මුද්‍රණය

14. තිර රාමු මුද්‍රණ ක්‍රමයේ දී රාමුවේ සවි කිරීමට ගන්නා රෙදි වර්ගයේ තිබිය යුතු ලක්ෂණ සහිත පිළිතුරු කාණ්ඩය වන්නේ,

A - රසායනික ද්‍රව්‍යන්ට ඔරොත්තු දීම.
B - සියුම් සිදුරු සහිත වීම.
C - නම්‍යශීලීත්වයකින් යුතු නොවීම.
D - ඇතිල්ලීමේ දී පලුදු නොවීම.

(1) ACD ය. (2) ABD ය. (3) ABC ය. (4) BCD ය.

15. රෙදි වර්ණ ගැන්වීමේ දී හා මුද්‍රණයේ දී ස්වභාවිකව හා බාහිරව එකතු වූ අපද්‍රව්‍ය ඊට බාධා ගෙනදෙයි. එම ද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය වන්නේ,

(1) ක්ලෝරීන්කරණය (2) පෙඟවීම (3) පෙර පිරියම් කිරීම (4) විරංජනය කිරීම

16. රෙදිපිළි අලංකරණය සඳහා යොදාගන්නා ක්‍රමයකි අච්චු මුද්‍රණය. අච්චු මුද්‍රණය සඳහා භාවිත කරනු ලබන අච්චු අතරින් ස්වභාවික අච්චුවක් නොවන්නේ,

(1) අර්තාපල් අල (2) නෙළුම් අල (3) හබරල පිති (4) බණ්ඩක්කා කරල්

17. අච්චු මුද්‍රණ ක්‍රමයට පිළි අලංකරණයෙන් ලැබෙන වාසියකි.


(1) රෙදි විකුණා ගැනීම පහසුවීම.

(2) කාලය ධනය වැය වීම.

(3) මෝස්තර කොටස් වෙන වෙන ම සකසගත යුතු වීම.

(4) එකම මෝස්තරය නැවත නැවත ලබා ගැනීමේ හැකියාව.

18. රූපයේ දැක්වෙන වියමන හැඳින්වෙන්නේ,



(1) සරල හීරි වියමන.

(2) දඟර හීරි වියමන.

(3) තුඩු හීරි වියමන.

(4) කඩහීරි වියමන.

19. රෙදි විවීම සඳහා කෙඳි භාවිතයෙන් නූල් සකස්කර ගනී. කෙඳි හඳුනාගැනීම සඳහා කෙන්ද්‍රක සිරස් තිරස් පෙනුම අනුව යොදා ගන්නා හඳුනා ගැනීමේ පරීක්ෂණය කුමක් ද?

(1) රසායනික පරීක්ෂණය. (2) අන්වීක්ෂීය පරීක්ෂණය.

(3) කඩා බැලීමේ පරීක්ෂාව. (4) ස්පර්ශ කිරීමේ පරීක්ෂාව.

20. ගිනි නිවීමේ භටයන්ගේ රෙදි සකස් කිරීම සඳහා වඩාත් ම සුදුසු කෙඳි විශේෂය වන්නේ,

(1) සේද කෙඳිය. (2) රෙයෝන් කෙඳිය. (3) ඇස්බැස්ටෝස් කෙඳිය. (4) ලෝම කෙඳිය.

21. කපු කෙඳි ලබා ගැනීමට කපු වර්ග රාශියක් යොදා ගනී. ඉතාම උසස් වර්ගයේ කපු ලෙස සැලකෙනුයේ,

(1) මිසර කපුය. (2) චීන කපුය. (3) සීඅයිලන්ඩ් කපුය. (4) ඉන්දියන් කපුය.

22. කෘතිම කෙඳි කාණ්ඩයට අයත් නොවන කෙඳි කාණ්ඩය තෝරන්න.

(1) ඇස්බැස්ටෝස්, නයිලෝන්, සේද (2) රෙයෝන්, කියුප්‍රමෝනියම්, ඕලෝන්

(3) ටෙරලින්, නයිලෝන්, රෙයෝන් (4) ඕලෝන්, ටෙරලින්, නයිලෝන්

23. ලිනන් කෙඳි ලබා ගැනීම සඳහා යොදා ගන්නා ශාක වර්ගය කුමක් ද?

(1) නියඳ (2) හණ (3) ජුට් (4) මැනිලා

24. හැඩපෙති උපයෝගී කර ගනිමින් විසිතුරු අලංකාර දේවල් වියාගනු ලැබේ. හැඩ පෙත්තක තිබිය යුතු ලක්ෂණයකි.

(1) ඍජුකෝණාස්‍රාකාර වීම.

(2) මුළු හතරෙහි කුඩා සිදුරු හතරක් තිබීම.

(3) මුළු හතර ඍජුකෝණාස්‍රාකාර වීම.

(4) නැමෙනසුළු වීම.

25. දන්තාලේප, තීන්ත, පුයර තාප පරිවාරික වැනි නිෂ්පාදන සඳහා යොදාගන්නා මැටි විශේෂය වන්නේ,

(1) ගිනි මැටි (2) රතු මැටි (3) ද්විතීක මැටි (4) ප්‍රාථමික මැටි

26. මැටි අංශුවක පමරිමාව අඩු වැඩි වීම මත සවිවරතා ගුණය ද අඩු වැඩි වේ. සවිවරතා දෝෂ අවම කර ගැනීමට යෙදිය හැක්කේ,

(1) රතු මැටි (2) කෙඔලින් (3) මයිකා මැටි (4) ග්‍රොග්

27. යන්ත්‍රානුසාරයෙන් මැ ටිපදම් කිරීමේ දී විවිධ යන්ත්‍ර උපයෝගී කර ගනී. රෝලර් ක්‍රෂර් නම් යන්ත්‍රයෙන් සිදු කෙරෙනුයේ,

(1) සියුම් ලෙස කුඩුකර ගැනීම. (2) ජලය සමඟ මැටි මිශ්‍ර කිරීම.

(3) වැඩි ජලය ඉවත් කිරීම. (4) මැටි රෝල් ලෙස යන්ත්‍රයෙන් පිටතට ඒම.

28. මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රමයකි.

(1) බෝල් මිල් ක්‍රමය. (2) මැටි පෙට්ටියේ දැමීම.

(3) අච්චු ක්‍රමය. (4) මහා පරිමාණ ක්‍රමය.

29. ඇලුමිනා සිලිකේට් හෙවත් මැටිවල විද්‍යාත්මක නාමය නිවැරදිව දැක්වෙන්නේ කුමන ප්‍රකාශයේ ද?

(1) $K_2OAl_2\,O_3\,6SiO_2$ (2) $AlO_2\,SiO_2\,H_2O$

(3) $Al_2\,O_3\,2Sio_2\,2H_2O$ (4) $OAl_2\,O_3\,2Sio_2\,HO_2$

30. මැටි තහඩු මගින් නිර්මාණය කරන භාණ්ඩ අලංකාර කිරීමට කැටයම් යොදගනී. මැටි තහඩුවේ (භාණ්ඩයේ) මදක් හැරීමෙන් මතුකර ගන්නා කැටයම හඳුන්වන්නේ,

(1) අල්ප උන්නත කැටයම් (2) අධි උන්නත කැටයම්


(3) අර්ධ උන්නත කැටයම් (4) සුවිකාර්ය කැටයම්

31. මල් සැකසුම් සඳහා විවිධ මල් වර්ග යොදාගනීම. අරලිය මල් සැකසුමකට අරලිය මල් කැඩිය යුත්තේ,

(1) රාත්‍රී කාලයේ (2) උදේ කාලයේ (3) දහවල් කාලයේ (4) අලුයම් කාලයේ

32. සුරතල් සතුන් නිර්මාණය වර්තමාන සමාජයේ ජනප්‍රිය අංගයකි. සුරතල් සතුන් නිර්මාණය සඳහා යොදා ගන්නා රෙදි විශේෂයකි.

(1) රෙයෝන් (2) පොලියෙස්ටර් (3) නයිලෝන් (4) වෙල්බෝවා

33.  රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය හඳුන්වන නාමය වන්නේ,

(1) ලේසිඩේසි මැස්ම (2) පිස්මේන්තු මැස්ම (3) හුරුළු කටු මැස්ම (4) බ්ලැන්කට් මැස්ම

34. (a) පතරොම අනුව පටි කැපීම. (b) කඩදාසි තීරු පටි කැපීම.

(c) කැපූ පටි එකිනෙක අලවා ගැනීම. (d) කඩදාසි පටි රෝල් කිරීම.

(e) රෝල්කරගත් කොටස් හැඩගැන්වීම. (f) සැකසූ නිර්මාණයට නිමාවක් දීම.

(g) සමතල මතුපිටක තබා අලවා ගැනීම. (h) අවශ්‍ය ප්‍රමාණයට ලිහිල් කිරීම.

පේපර් ක්විලින් නිර්මාණ කිරීමේ දී ඉහත සඳහන් පියවරයන් අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) a, d, e, h, g, f (2) b, d, e, h, g f (3) b, c, d, f, h, g (4) a, c, d, e, g, h

35. කඩදාසි විරූපන යන්ත්‍රය මගින් සිදු කරනු ලබන්නේ,

(1) කඩදාසි පටි රෝල් කිරීම. (2) කඩදාසි පටි කපා ගැනීම.

(3) කඩදාසි පටි හැඩගැන්වීම. (4) පටි ඇලවීම.

36. උද්‍යාන අලංකරණ නිර්මාණ ඉතා ජනප්‍රිය අංගයකි. උද්‍යාන අලංකරණ නිර්මාණයේ දී අවධානය යොමු කළ යුතු අංගයකි.

(1) සම්පින්ඩණය. (2) විශාලත්වය.

(3) ගෙනයාහැකි වීම. (4) පහසුවෙන් සැකසිය හැකි වීම.

37. කඩදාසි පල්ල භාවිතයෙන් උද්‍යාන අලංකරණ නිර්මාණ කිරීමේ දී සතුන්ගෙන් වන හානිය අවම කිරීම සඳහා යොදා ගනු ලබන්නේ,

(1) සිමෙන්ති. (2) බයින්ඩර් ගම්. (3) කෝන් පිටි. (4) පල්මානික්කම්.

38. අතීතයේ ද උද්‍යාන අලංකරණ නිර්මාණ සකස් කල බවට සාක්ෂි හමුව තිබේ. අතීතයේ උද්‍යාන නිර්මාණ සැලසීම සහා යොදාගෙන ඇති මාධ්‍ය වන්නේ,

(1) සිමෙන්ති (2) ප්ලාස්ටර් ඔෆ් පැරිස් (3) හුණු (4) මැටි

39. සුරතල් සතුන් මෙන් ම බෝනික්කන් ද නිර්මාණය කොට අලෙවි කිරීම වර්තමානයේ බහුලව දැකිය හැකිය. සෙල්ලම් සතුන් නිර්මාණයට යොදා ගන්නා රෙදි විශේෂය වන්නේ,

(1) නෙට් රෙදි (2) වොයිල් රෙදි (3) ෆෙල්ට් (4) නයිලෝන් රෙදි

40. පල්ප, ප්ලාස්ටර් ඔෆ් පැරිස් ඇසුරින් කරනු ලබන මූර්ති වර්ණ ගැන්වීමෙන් පසු පිරියමක් ලෙස ආලේප කරනු ලබන්නේ,

(1) පැබ්රික් වර්ණක (2) ක්ලියර් වාර්නිෂ්

(3) ප්ලාස්ටර් ඔෆ් පැරිස් දියර (4) කරාබු නැටි තෙල්

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 11 - 2023**

# ශිල්ප කලා - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. රැකියා විරහිත කාන්තාවන්ගේ ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින්, සාම්ප්‍රදායික ජනකලාවන් ආශ්‍රිත නිර්මාණ අලෙවිය, පුහුණු වැඩමුළු හා ප්‍රදර්ශන ''දිරයෙන් පෙරට'' යන තේමාව යටතේ ග්‍රාමීයව පැවැත්වීමට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කොට තිබුණි.

(1) මෙම වැඩසටහන සඳහා යෙදිය හැකි වෙනත් තේමා පාඨයක් ලියන්න.

(2) ප්‍රදර්ශන කුටියට ඇතුළුවන දොරටුව ස්වභාවික ද්‍රව්‍ය යොදාගනිමින් තොරණක් සකස් කර තිබුණි. ඒ සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය හතරක් ලියන්න.

(3) උත්සව ශාලාව අලංකාර ලෙස සරසා තිබුණි. ඒ සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය හතරක් නම් කරන්න.

(4) නිවේදක පුවරුව අලංකාර කිරීමට සුදුසු සැරසිල්ලක් අඳින්න.

(5) උත්සව සංවිධායක මණ්ඩලයට පැළඳීමට සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

(6) රෙදි කැබලි අලවා හෝ මසා නිමකරගත හැකි නිර්මාණ 02 නම් කරන්න.

(7) සාම්ප්‍රදායික නිර්මාණවලට අයත් වන මැටි භාණ්ඩ අලංකාර කිරීමට භාවිත කළ හැකි අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.

(8) අත්යන්ත්‍ර භාවිතයෙන් විවිධ රෙදිපිළි නිෂ්පාදන අලෙවියට තබා තිබුණි. අත් යන්ත්‍ර රෙදි වියීමේ දී භාවිතයට ගත හැකි වාම් වියමනේ ප්‍රභේද 2 ක් ඇඳ නම් කරන්න.

(9) විවිධ ජ්‍යාමිතික හැඩතල යොදා ගනිමින් බිත්ති සැරසිලි, පාපිසි, මල්බඳුන් ප්‍රදර්ශනයට තබා තිබුණි. ඒ සඳහා යොදාගත හැකි ජ්‍යාමිතික හැඩතල 04 ක් අඳින්න.

(10) සාම්ප්‍රදායික කලාවට මුල්තැන දෙමින් නිර්මාණ රාශියක් ප්‍රදර්ශනයට තබා තිබුණි. සාම්ප්‍රදායික මෝස්තරයකට සුදුසු නිර්මාණයක් අඳින්න.

02. ඈත අතීතයේ සිට ම මිනිසා අලංකාර ලෙස ඇඳුම් පැළඳුම් ඇඳීමට කැමැත්තක් දක්වයි.

(1) සායම් භාවිතයෙන් පිළි අලංකාර කරගන්නා ක්‍රම 04 ක් නම් කරන්න.

(2) සිදුරු තහඩු ක්‍රමයට කොට්ට උරයක් අලංකාර කර ගැනීමට සුදුසු මෝස්තරයක් අඳින්න.

(3) ස්ටෙන්සිල් මුද්‍රණ ක්‍රමය භාවිතයෙන් ලේන්සුවක් අලංකාර කර ගන්නා ආකාරය ලියන්න.

(ලකුණු 10)

03. අත් යන්ත්‍රයක අත්පිස්නා වියා ගැනීමට සකස් කරන ලද නූල් හැදයක දළ රූපසටහනක් සහ තොරතුරු පහත දැක්වේ.


හැදයේ දිග 100 m

හැදයේ පළල 40 cm

එක් සෙ. මී. දික් නූල් 30 කි.

නූලේ නොම්මරය $2/40^s$

නූලේ වර්ණය කහ පාට




(1) අත්පිස්නා වියා ගැනීමට සුදුසු වියමන් රටා 02 ක් නම් කරන්න.

(2) නම් කරන ලද වියමන් රටා දෙකෙන් එක් වියමන් රටාවක නූල් මතුවීම ඇඳ දක්වන්න.

(3) හැදය විවීමට අවශ්‍ය $^{2}/_{40}$ s නූල් ප්‍රමාණය (බර) ගණනය කරන්න. (ලකුණු 10)

04. රූපයේ දැක්වෙන්නේ පෑන් පැන්සල් රඳවනයකි.



(1) මෙම බඳුනේ දැකිය හැකි ජ්‍යාමිතික හැඩතල 02 ක් නම් කරන්න.

(2) මෙම බඳුන සකස් කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න.

(3) මැටි දරණු භාවිතයෙන් මල් බඳුනක් සාදා ගන්නා ආකාරය පිළිවෙලින් විස්තර කරන්න. (ලකුණු 10)

05. පොදු ස්ථානවල මෙන් ම තම ගෙවත්ත ද අලංකාරව තබා ගැනීමට බොහෝදෙනා උත්සහ ගනී.

(1) උද්‍යාන අලංකරණයේ දී අවධානය යොමු කළ යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම හතරක් නම් කරන්න.

(2) මූර්ති ගොඩනැගීමේ දී පූර්ණ උන්නත, අර්ධ උන්නත හා අල්ප උන්නත යන ක්‍රම භාවිත කෙරේ. ඒවා එකිනෙක කෙටියෙන් විස්තර කරන්න.

(3) උද්‍යාන අලංකරණය සඳහා මූර්තියක් සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

06. රෙදිපිළි නිෂ්පාදනය සඳහා වර්තමානයේ පේෂ කර්මාන්ත තාක්ෂණය සංවර්ධනය වෙමින් පවතී.

(1) රෙදි විවීම සඳහා භාවිත කෙරෙන යන්ත්‍ර වර්ග 4 නම් කරන්න.

(2) නූල් එතීමේ උපකරණ කට්ටලය නම් කර ඉන් එක් උපකරණයක රූපසටහනක් අඳින්න.

(3) ජවනඩා යන්ත්‍රයක කොටස් 2 ක් නම් කර එම කොටස්වලින් කෙරෙන කාර්යය විස්තර කරන්න.

(ලකුණු 10)

07. ඇඳුම් පැළඳුම් මෙන් ම ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමය යොදා ගනී.

(1) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා භාවිත වන මැහුම් ක්‍රම දෙකක් නම් කරන්න.

(2) වූල් උපයෝගී කර ගනිමින් නිර්මාණය කර ගන්නා ඇඳුම් පැළඳුම් අතරින් හතරක් නම් කරන්න.

(3) රිබන් ආශ්‍රයෙන් බිත්ති සැරසිල්ලක් සිදු කිරීමට සුදුසු මෝස්තරයක දළ සැලැස්මක් අඳින්න.

(ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (2) | 03. (3) | 04. (1) | 05. (4) | 06. (2) | 07. (1) | 08. (3) | 09. (4) | 10. (3) |
| 11. (2) | 12. (1) | 13. (4) | 14. (2) | 15. (3) | 16. (1) | 17. (4) | 18. (1) | 19. (2) | 20. (3) |
| 21. (3) | 22. (1) | 23. (2) | 24. (2) | 25. (4) | 26. (4) | 27. (1) | 28. (3) | 29. (3) | 30. (1) |
| 31. (1) | 32. (4) | 33. (3) | 34. (2) | 35. (2) | 36. (1) | 37. (4) | 38. (4) | 39. (3) | 40. (2) |

**II පත්‍රය**

01. (1) සුදුසු තේමා පාඨයකට ලකුණු දෙන්න.
(2) පොල් කොළ, ගොක් කොළ, ෆම්ස් අතු, ඇන්තුරියම්, ක්‍රෝටන්, අරලිය කොළ වැනි දෑ
(3) ඇන්තුරියම් මල්, මීවන ශාක, හබරල කොළ, ක්‍රෝටන් කොළ වැනි සුදුසු දෙයක් සඳහා ලකුණ දෙන්න.
(4) කතන පුවරුව අලංකාර කර ඇති ආකාරය දක්වන සුදුසු සැරසිල්ලකට ලකුණු දෙන්න.
(5) සුදුසු ලාංඡනයක ලකුණු දෙන්න.
(6) කුෂන් කවර, කොට්ට උර, සාරි, බිත්ති සැරසිලි යනාදිය
(7) කැටයම් කිරීම, සීරුම් රටා යෙදීම වැනි ක්‍රම.
(8) චාම්, ජටා දික්දාර හරස්දාරයන වියමන් අතරින් දෙකක් ඇඳ නම් කිරීම.
(9) සමචතුරස්‍ර, ත්‍රිකෝණය, ඍජුකෝණාස්‍රය, ඉලිප්සය වැනි හැඩතල ඇඳ නම් කිරීම.
(10) සුදුසු මෝස්තරයකට ලකුණු දෙන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (1) අතින් පින්තාරු කිරීම. (සායම් ආලේප කිරීම), ස්ටෙන්සිල් (සිදුරු තහඩු මුද්‍රණය), අච්චු මුද්‍රණය, සේදරාමු මුද්‍රණය යනාදී ක්‍රම සඳහා මුද්‍රණය යනාදී සඳහා (ලකුණු 02)
(2) සුදුසු මෝස්තරයකට (ලකුණු 04)
(3) අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ ලිවීම, සකස් කර ගන්නා ආකාරය පියවර අනුව ලිවීම. (ලකුණු 04)

03. (1) ජටා වියමන, රළහීරි වියමන (ලකුණු 02)
(2) එක් වියමනක රටාව ඇඳීමට (ලකුණු 04)
(3)

$$\frac{\text{හැඳයේ දිග} \times \text{පළල} \times 1\text{cm තිබෙන දික් නූල්}}{\text{නූල් කැරැල්ලක දිග} \times \text{නූල් අංකය}}$$

$$= \frac{100 \times 40 \times 30 \times 2}{1000 \times 40}$$

$$= \underline{\underline{6\text{kg}}}$$

04. (1) ඉලිප්සය, වෘත්තය (ලකුණු 02)
(2) මැටි උණබට ලී වැනි අමුද්‍රව්‍ය අනුව අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ නම් කිරීමට ලකුණු දෙන්න. (ලකුණු 04)
(3) අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ නම් කිරීමට සකස් කරගන්නා ආකාරය පියවරෙන් පියවර විස්තර කිරීමට ලකුණු දෙන්න. (ලකුණු 04)

05. (1) අවකාශය, අනුපාතය, විවිධත්වය, කැපී පෙනෙන සුළු බව, සමබරතාව යනාදී කරුණු 04 ක් සඳහා (ලකුණු 02)
(2) පූර්ණ උන්නත - නිර්මාණය සම්පූර්ණයෙන් මතුකර දැක්වෙන පරිදි ගොඩනැගීම පූර්ණ උන්නත ලෙස හැඳින්වේ.
අර්ධ උන්නත - මූර්තියේ අඩක් මතුවන ලෙස ගොඩනැගීම අර්ධ උන්නත ලෙස හැඳින්වේ.
අල්ප උන්නත - මූර්තිය මඳ වශයෙන් මතුකර දැක්වීම අල්ප උන්නත ලෙස හැඳින් වේ. (ලකුණු 04)
(3) අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ නම්කර සකස් කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කිරීමට (ලකුණු 04)

06. (1) මේස යන්ත්‍රය, චාම් යන්ත්‍රය, ජවනඩා යන්ත්‍රය, බලවේග යන්ත්‍රය (ලකුණු 02)
(2) මල් චක්‍රය, එතුම් රෝදය, එතුම් කර, දික්නූල් කුරු හා හැඩ නූල් කුරු නම් කිරීම එක් උපකරණයක රූපසටහන ඇඳීම (ලකුණු 04)
(3) යන්ත්‍ර රාමුව, නූල් කඳ, පිළි කඳ, පුඩුවැල්, පනාව පාපොලු යනාදී කොටස් දෙකක් නම්කර කෙටියෙන් කාර්යය විස්තර කිරීම. (ලකුණු 04)

07. (1) රිබන් මැස්ම, කෙලින් මැස්ම, ලේසඩේසි මැස්ම, ලූප් මැස්ම, ප්‍රංශ ගැට මැස්ම, නැටි මැස්ම යනාදීයෙන් 2 කට ලකුණු දෙන්න. (ලකුණු 02)
(2) තොප්පි, මේස්, සපත්තු (ළදරු), ශීත කබා, කුඩා ගවුම්, බඳුන්පලස්, ටීපෝ කවර, බෝතල් කවර (ලකුණු 04)
(3) අඳින ලද ගැළපෙන සුදුසු මෝස්තරයකට ලකුණු දෙන්න. (ලකුණු 04)